tamilguru.lk



## කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
## ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

### ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන නිලධාරි තනතුරේ II ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2026

කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයට අයත් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති ගොවිජන සංවර්ධන නිලධාරි තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් 2026 සැප්තැම්බර් මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026 ජුනි මස 08 දින වේ. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 මැයි මස 11 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 ජුනි මස 08 වැනි දින ප.ව. 09.00ට අවසන් වේ.**

1.2 දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

1.3 අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

1.4 මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිංහල හා දෙමළ මාධ්‍යවලින්උපලේඛන - 1 යටතේ දක්වා ඇති දිස්ත්‍රික්කවල පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පවත්වනවා ඇත. ඒ අනුව විභාගයට පෙනී සිටින දිස්ත්‍රික්කය හා ඊට අදාළ අංක පළමු හා දෙවන කැමැත්ත අනුව ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂයේ දක්වා ඇති කොටුව තුළ නිවැරදිව සඳහන් කළ යුතු ය. විභාග සඳහා ඉල්ලුම් කළ දිස්ත්‍රික්කය/ දිස්ත්‍රික්ක පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. කිසියම් මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් නොමැති විට අයදුම්කරුගේ දෙවන කැමැත්ත අනුව හෝ ආසන්න වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත හෝ යොමු කරනු ඇත. යෝජිත දිස්ත්‍රික්ක සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කෙරෙනු ඇත.

1.5 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(2) සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

2.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් වේ. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

2.2 රාජ්‍ය සේවයේ පත්වීම් සම්බන්ධයෙන් වන ආයතන සංග්‍රහයේ පළමු කාණ්ඩයේ 11පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්ති ද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති ද අදාළ වේ.

2.3 තෝරා ගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තු නියෝගවලට ද කලින් කලට රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද යටත් විය යුතු ය.

(3) සාමාන්‍ය සුදුසුකම් :

3.1 ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

3.2 විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

3.3 සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතු ය.

3.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව 2005/06/08 දිනට හෝ ඊට පෙර හා 1991/06/08 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

3.5 කුමන හෝ ආගමක පැවිදිවරයක් දරන කිසිම තැනැත්තකුට මෙම තරග විභාගයට අයදුම්කිරීමට හෝ පෙනී සිටීමට අවසර නොමැත.

(4) අධ්‍යාපන සුදුසුකම්:

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

(5) බඳවා ගැනීමේ ක්‍රමය:

5.1 ලිඛිත තරග විභාගයේ කොන්දේසි:

ලිඛිත විභාගයේ එක් එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ඔවුන් ලබා ගත් මුළු ලකුණු සංඛ්‍යාවේ කුසලතා අනුපිළිවෙළට පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම් සිදු කෙරේ.

5.2 ලිඛිත තරග විභාගයට අදාළ විෂය නිර්දේශය:
විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

1. අවබෝධය - කාලය පැය 01 ½ යි - මුළු ලකුණු 100 යි
2. බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 ½ යි - මුළු ලකුණු 100 යි

(සාමර්ථය සඳහා එක් එක් විෂයයට, මුළු ලකුණු වලින් 40% ක් හෝ ඊට වැඩියෙන් අපේක්ෂකයන් විසින් ලබා ගත යුතුය.)

01. අවබෝධය :

මෙම ප්‍රශ්න පත්‍රය මගින් කෙටි පාඨ ගණනාවක් අපේක්ෂකයන් වෙත දෙනු ලැබේ. ඇතැම් පාඨ දෙන්නේ එහි අර්ථය එක් වාක්‍යකින් ප්‍රකාශ කිරීම පිණිසයි. යටින් ඉරි ඇඳි පදවලට විවරණ සැපයීම් ප්‍රශ්න දෙනු ලැබේ. තවත් ඇතැම් පාඨ සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශ ගණනාවක් ඉදිරිපත් කරන අතර, ඉන් එකක් මෙම පාඨයේ අන්තර්ගත කරුණුවලට වඩාත්ම ගැළපෙයි. අපේක්ෂකයින් මින් වඩාත්ම උචිත ප්‍රකාශය තෝරා ගත යුතු වේ. තවත් ඇතැම් පාඨ සම්බන්ධයෙන් අපේක්ෂකයා වෙත ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කරන අතර, ඒවාට නිවැරදි පිළිතුර දීම අපේක්ෂා කෙරේ. මේ ප්‍රශ්න පිළියෙළ කරන්නේ අපේක්ෂකයා එම පාඨයන්ගේ අර්ථය වටහා ගන්නා ආකාරය පරීක්ෂා කිරීම සඳහාය.

02. බුද්ධි පරීක්ෂණය:

මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත්තේ අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල තත්ත්වයත්, ඔහුගේ සිතෙහි විශ්ලේෂණ තත්ත්වයත්, ඔහුගේ තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහාය. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ක්‍රමයට ගැළපෙන ප්‍රශ්නවලින් යුක්ත වේ.

5.3 සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලබන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

5.4 විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලැබේ. තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් මාධ්‍ය වෙනස් කිරීමට අපේක්ෂකයන්ට ඉඩ දෙනු නොලැබේ. අපේක්ෂකයකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂා මාධ්‍යයකින් පිළිතුරු දිය යුතු ය.

5.5 ප්‍රතිඵල නිකුත් කිරීම:

ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයය සඳහා ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගන්නා අපේක්ෂකයන්ගේ මුළු ලකුණු කුසලතා අනුපිළිවෙළට සකස් කරන ලද ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා වෙත ලබාදෙනු ඇත.

පත්වීම් බලධාරියාගේ එකඟතාව ලද පසුව සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ

www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

(6) වැටුප් පරිමාණය (මාසික):

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි MN-05-2025 යටතේ රු.58,660-10x1,190-11x1,360-15x1,670-110,570 වේ.

(7) උසස් කිරීමේ පරිපාටිය:

ගොවිජන සංවර්ධන නිලධාරි තනතුරේ බඳවා ගැනීම් පරිපාටිය අදාළ වේ.

(8) විභාග ගාස්තු:

විභාග ගාස්තුව රු.600 කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය:-

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);
II. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions);
III. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය මගින් (Online Banking Method of Bank of Ceylon);
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon).

*සටහන :*

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

(9) රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම:

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 03 ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

(10) අත්සන සහතික කිරීම:

ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු හෝ සාමදාන විනිශ්චකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු හෝ නීතිඥවරයකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියකු හෝ රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කළ යුතු ය. විභාගය ආරම්භ වන දිනයේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයයි. එසේ අත්සන සහතික කරවා නොගත් ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් කරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

(11) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(12) අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(13) විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ:

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය,

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන කිසිවකු විභාග ශාලාවට ඇතුළත් කර නොගත යුතු ය. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

(14) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට/ඇයට සිදු වනු ඇත.විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

(15) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**ධම්මික රණතුංග,**
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2026 අප්‍රේල් මස 24 දින,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
තැ.පෙ.537,
කොළඹ 07.

## උපලේඛන - 1

විභාග මධ්‍යස්ථාන පිහිටුවා ඇති දිස්ත්‍රික් අංක පහත දැක්වෙන ලැයිස්තුවෙන් තෝරා ගන්න.

මෙම විභාගය පහත සඳහන් දිස්ත්‍රික්කවලදී පවත්වනු ඇත. අයදුම්කරුවන් තමන් පදිංචි ලිපිනයට ආසන්නතම දිස්ත්‍රික්කය තම විභාග මධ්‍යස්ථානය ලෙස තෝරා ගත යුතු ය. විභාගයට පෙනී සිටින දිස්ත්‍රික් හා දිස්ත්‍රික්ක අංක පහත සඳහන් වගුවට අනුව ඉල්ලුම්පත්‍රයේ සඳහන් කළ යුතු ය. ඉල්ලුම් කළ දිස්ත්‍රික්කය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *දිස්ත්‍රික්ක අංක* |
|---|---|---|
| බස්නාහිර | කොළඹ | 01 |
| | ගම්පහ | 02 |
| | කළුතර | 03 |
| මධ්‍යම | මහනුවර | 04 |
| | මාතලේ | 05 |
| | නුවරඑළිය | 06 |
| දකුණු | ගාල්ල | 07 |
| | මාතර | 08 |
| | හම්බන්තොට | 09 |
| උතුරු | යාපනය | 10 |
| | මන්නාරම | 11 |
| | වව්නියාව | 12 |
| | මුලතිව් | 13 |
| | කිලිනොච්චිය | 14 |
| නැගෙනහිර | මඩකලපුව | 15 |
| | අම්පාර | 16 |
| | ත්‍රිකුණාමලය | 17 |
| වයඹ | කුරුණෑගල | 18 |
| | පුත්තලම | 19 |
| උතුරු මැද | අනුරාධපුරය | 20 |
| | පොළොන්නරුව | 21 |
| ඌව | බදුල්ල | 22 |
| | මොනරාගල | 23 |
| සබරගමුව | රත්නපුර | 24 |
| | කෑගල්ල | 25 |